ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# <u>පුවත්පත් නිවේදනය</u>

## 'බුද්ධං සරණං ගච්ඡාමි': නූතනත්වය හා සම්ප්‍රදාය මුසු වූ ප්‍රදර්ශනයක්

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය බුද්ධ රශ්මි ජාතික වෙසක් උළෙල හා සමගාමීව නූතන ඉන්දීය කලාවේ ප්‍රවීණයන් විසින් බුදුන් වහන්සේගේ ජීවිතයේ විවිධ අවස්ථා නිරූපණය කරමින් නිර්මාණය කරන ලද සිතුවම් රැසක් **ඇතුළත් 'බුද්ධං සරණං ගච්ඡාමි'** යන විශේෂ ප්‍රදර්ශනය කොළඹ, ගංගාරාම විහාරයේ සීමාමාලකයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

2. ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගංගාරාම විහාරය එක්ව සංවිධානය කර ඇති බුද්ධ රශ්මි ජාතික වෙසක් උළෙල 2024 මැයි 23 වන දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් සමාරම්භ කිරීමත් සමඟ ප්‍රදර්ශනය විවෘත වූ අතර එම අවස්ථාව සඳහා මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.

3. මෙම ප්‍රදර්ශනයේ පවතින විශේෂත්වයක් වන්නේ නරඹන්නන්ට බෞද්ධ කලාවේ දෘශ්‍යාකර්ෂණය මෙන්ම ප්‍රඥාව, කරුණාව සහ සාමය යන විශ්වීය වටිනාකම් රැගත් ආධ්‍යාත්මික සාරය ගවේෂණය කිරීමට ඉඩ හසර ලබාදෙමින් නිර්මාණය කර ඇති ඩිජිටල් කුටිය යි. මෙම ප්‍රදර්ශනය ඉන්දියාවේ නව දිල්ලි නූතන කලාගාරය විසින් සම්පාදනය කර ඇති අතර එය ප්‍රථම වරට 2023 වසරේ වෙසක් දිනය නිමිත්තෙන් නව දිල්ලියේ දී ප්‍රදර්ශනය කරන ලදී.

4. ප්‍රදර්ශනය 2024 මැයි 23 වන දින ප.ව. 7 සිට 2024 මැයි 26 වන දින දක්වා මහජනතාව සඳහා විවෘතව පවතී.

***

***කොළඹ***
***2024 මැයි 23***